**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.01.20**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. ඥානතිලක මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. ඥානතිලක මහතා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි වූ නිලධාරීන් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.

02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**<u>ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.01.20 දින පැවති මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.</u>**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.01.20 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්,පිළිගැනීමෙන් අනතුරුව, න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

❖ 2021.12.24 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

<u>ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා</u>
ගරු මන්ත්‍රීතුමනි, 2021.12.24 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් මස 24 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.**

**සංශෝධන අංක 01**
**යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 02 යටතේ, 2022 වර්ෂය සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ පත්කර ගත් ස්ථාවර කමිටු පහත පරිදි සංශෝධනය කරන ලදි.**

| අනු අං: | කමිටුව | සාමාජිකයාගේ නම | තනතුර |
|---|---|---|---|
| **01.** | මුදල් හා ප්‍රතිපත්ති කමිටුව | I. ගරු සභාපති ඩබ්.සුරන්ත වීරසිංහ මහතා<br>II. ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා<br>III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා<br>IV. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි මිය<br>V. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා<br>VI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රත්නායක මහතා<br>VII. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. උපුල් කිත්සිරි මහතා<br>VIII. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පැතුම් මධුශංඛ මහතා<br>IX. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා<br>X. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සීතා පද්මිණී මිය<br>XI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා | සභාපති<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික<br>සාමාජික |

| | | | | |
|---|---|---|---|---|
| **02.** | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | I. | ගරු සභාපති ඩබ්.සුරන්ත වීරසිංහ මහතා | සභාපති |
| | | II. | ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා | සාමාජික |
| | | III. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා | සාමාජික |
| | | IV. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය | සාමාජික |
| | | V. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා පුෂ්පකුමාරි මිය | සාමාජික |
| | | VI. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා | සාමාජික |
| | | VII. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා | සාමාජික |
| | | VIII. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා | සාමාජික |
| | | IX. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. උපුල් කිත්සිරි මහතා | සාමාජික |
| | | X. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා | සාමාජික |
| | | XI. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ අමිත් රණතුංග මහතා | සාමාජික |
| **03.** | පරිසර හා පහසුකම් කමිටුව | I. | ගරු සභාපති ඩබ්.සුරන්ත වීරසිංහ මහතා | සභාපති |
| | | II. | ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා | සාමාජික |
| | | III. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. ඥානතිලක මහතා | සාමාජික |
| | | IV. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා | සාමාජික |
| | | V. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.මල්ක මධුභාෂණ මහතා | සාමාජික |
| | | VI. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා | සාමාජික |
| | | VII. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී අනෝමා රෝෂිණී මෙනවිය | සාමාජික |
| | | VIII. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා | සාමාජික |
| | | IX. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා | සාමාජික |
| | | X. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා | සාමාජික |
| | | XI. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත රත්නායක මහතා | සාමාජික |
| **04.** | තාක්ෂණික සේවා කමිටුව | I. | ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා | සභාපති |
| | | II. | ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා | සාමාජික |
| | | III. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මිය | සාමාජික |
| | | IV. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා | සාමාජික |
| | | V. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.මල්ක මධුභාෂණ මහතා | සාමාජික |
| | | VI. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත කුමාරසිරි මහතා | සාමාජික |
| | | VII. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනක දිසානායක මහතා | සාමාජික |
| | | VIII. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී අශානි ප්‍රියංගිකා මිය | සාමාජික |
| | | IX. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පැතුම් මධුශංඛ මහතා | සාමාජික |
| | | X. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ අමිත් රණතුංග මහතා | සාමාජික |
| | | XI. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා | සාමාජික |
| | | XII. | | සාමාජික |

**02. ගරු සභාපතිතුමාගේ නිවේදන.**

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.ඥාණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.ඥාණතිලක මහතා අසනීප තත්ත්වයේ පසුවන බැවින් අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බව දන්වමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ඔහුගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා අසනීප තත්ත්වයේ පසුවන බැවින් අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බව දන්වමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ඔහුගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**03. සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරිම.**
**නැත.**

**04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.**
**නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05.01) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට රු:1,000,000.00ක් දක්වා වියදම් අනුමත කිරීමේ බලය ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

මෙම ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට මෙතෙක් කල් බලය තිබුණේ රු:500,000.00ක් දක්වා වියදම් අනුමත කරන්න විතරයි. මම යෝජනා කරනවා, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට රු:1,000,000.00ක් දක්වා වියදම් අනුමත කිරීමේ බලය ලබාදීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

කාලෝචිත යෝජනාවක්.ඒ යෝජනාව ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට රු:1,000,000.00ක් දක්වා වියදම් අනුමත කිරීමේ බලය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව ඒසඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ZA 5014 අංක දරණ බැකෝ ලෝඩරය අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ZA 5014 අංක දරණ බැකෝ ලෝඩරය,**

- ට්‍රාන්ස්මිෂන් කූලර්
- බැටරි මේන් ස්විච්
- මෝටර් පම්ප්
- ටර්බෝ රෙපයාර් කිට්
- ට්‍රාන්ස්මිෂන් හෝස්
- හීට් මීටර් සෙන්සර්
- මේන් සොලනයිට්

යන අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ZA 5014 අංක දරණ බැකෝ ලෝඩරය ඉහත සඳහන් අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ජල බවුසරය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

මෙම ප්‍රාදේශීය සභාව සතු ජල බවුසරය තැන් තැන්වලින් පළුදු වෙලා තියෙන්නේ.එම ජල බවුසරය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ජල බවුසරය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.04) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයාලේ යන ගවයන් ඇල්ලීම සඳහාත්,ඊට අදාලව වැය වන,**

- **ගවයන් ඇල්ලීමේ කුලිය**
- **ගවයන් ආරක්ෂා කිරීමේ මුරකරු කුලිය**
- **ගවයන්ට ආහාර හා ජලය සැපයීමේ කම්කරු කුලිය**

**යන වියදම් සහා අරමුදල මගින් දැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

කුට්ටිගල ජනතාවත්,කුට්ටිගල පොලීසියත් දිගින් දිගටම මගෙන් ඉල්ලීම් කළා, මෙම අයාලේ යන ගවයන් සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා.විශේෂයෙන්ම මෙම අයාලේ යන ගවයන් නිසා රිය අනතුරු රාශියක් සිදු වී තිබෙනවා.තුංකම සිට කුට්ටිගල පදලංගල දක්වාත්,උඩවලව ප්‍රදේශයේත් මෙම ප්‍රශ්නය බොහෝ දුරට තිබෙනවා.මේ සඳහා යම්කිසි මුදලක් වැය වෙනවා.ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයාලේ යන ගවයන් ඇල්ලීම සඳහාත්. ඊට අදාලව වැයවන ඉහත වියදම් සහා අරමුදල මගින් දැරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ගරු සභාපතිතුමණි,කොහොමත් මේ සඳා වැය වන මුදල් පනත අනුව අය කරගන්න අපට පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා

ගරු සභාපතිතුමණි,මේ සඳහා සභාවෙන් වැය වන මුදග් නැවත අය කරගන්න පුළුවන්.මේ කරුණු තුනටම දරණ වියදම් අය කරගන්න පනතේ විධි විධාන තියෙනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයාලේ යන ගවයන් ඇල්ලීම සඳහාත්,ඊට අදාලව වැය වන,**
  - **ගවයන් ඇල්ලීමේ කුලිය**
  - **ගවයන් ආරක්ෂා කිරීමේ මුරකරු කුලිය**
  - **ගවයන්ට ආහාර හා ජලය සැපයීමේ කම්කරු කුලිය**

**යන වියදම් සහා අරමුදල මගින් දැරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.05) කොරෝනා වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් 2021 වර්ෂයේ අප්‍රේල් මස සිට 2021 සැප්තැම්බර් මාසය දක්වා ව්‍යාපාරික ස්ථාන වසා තිබූ බැවින් එම ව්‍යාපාරික ස්ථානවලට අදාල,**

- **රු:287,000.00ක් වන බලපත්‍ර ගාස්තු**
- **රු:857,650.00ක ව්‍යාපාර හා කර්මාන්ත බදු**

**ලේඛණවලින් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ යෝජනාව.**

- ➢ **මෙම යෝජනාව ඊළඟ සභා වාරයට කල් තබන ලදි.**

**05.06) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතිය මගින්, ජල අංක 113 යටතේ ජලය ලබා ගන්නා ආර්.කේ.රොස්ලින් යන අයගේ ජල සම්බන්ධතාවය පිළිබඳව තීරණයක් ලබා ගැනීමට හා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ආර්.කේ.රොස්ලින් කියන්නේ අවුරුදු 70ක් විතර වෙන වයස්ගත කාන්තාවක්.අදාල ජල සම්බන්ධතාවය හිමි නිවසේ ඇය තනිවම තමයි ජීවත් වෙන්නේ.රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැති බවත්,කිසිදු ආදායම් මාර්ගයක් නොමැති නිසා ජල ගාස්තු ගෙවීමට හැකියාවක් නොමැති බවත්,එබැවින් ඇයගෙන් ජල ගාස්තු අය නොකරන ලෙසටත්, මාගෙන් ඉල්ලීමක් කළා. ඇය විසින් පවසන ලද කාරණා සියල්ල සත්‍යයක්.ඒ වගේම ඇයගේ ජල සම්බන්ධතාවයට අදාලව රු:3750.00ක හි ජල ගාස්තුවකුත් ලේඛණවල ඉදිරියට එනවා.ඒ හි ජල ගාස්තු ගෙවීමටත් ඇයට හැකියාවක් නැහැ.එම නිසා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතිය මගින්, ජල අංක 113 යටතේ ජලය ලබා ගන්නා ආර්.කේ.රොස්ලින් යන අයගේ ජල සම්බන්ධතාවයට අදාල රු:3,750.00ක හිඟ ජල ගාස්තුව (2020 ඔක්තෝම්බර් සිට 2021 දෙසැම්බර් මස දක්වා) ලේඛණයෙන් කපා හැරීම සඳහාත්, 2022 ජනවාරි මස සිට ජීවත්ව සිටිනා තුරු ආර්.කේ.රොස්ලින් යන අයට නොමිලේ ජලය ලබාදීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- ➢ **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතිය මගින්, ජල අංක 113 යටතේ ජලය ලබා ගන්නා ආර්.කේ.රොස්ලින් යන අයගේ ජල සම්බන්ධතාවයට අදාල රු3,750.00ක හිඟ ජල ගාස්තුව (2020 ඔක්තෝම්බර් සිට 2021 දෙසැම්බර් මස දක්වා) ලේඛණයෙන් කපා හැරීම සඳහාත්, 2022 ජනවාරි මස සිට ජීවත්ව සිටිනා තුරු ආර්.කේ.රොස්ලින් යන අයට නොමිලේ ජලය ලබාදීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.07) 2021 දෙසැම්බර් මස ලක්ෂ 05 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2021 දෙසැම්බර් මස මෙම සභාවේ ලක්ෂ 05ට වැඩි වියදම් 05ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|
| 01 | 2021.12.02 | 1485 | 766889 | නිව් ශාස්ත්‍රෝදය ප්‍රින්ටර්ස් | මුද්‍රිත ලේඛණ මිලදී ගැනීම | 617750.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02 | 2021.12.02 | 1489 | 766893 | කුඹුගොඩආර වැඩිහිටි සංවිධානය | කුඹුගොඩආර බලාගාර 02 පටුමග සංවර්ධනය | 528267.60 |
| 03 | 2021.12.02 | 1490 | 766894 | සී/ස මුල්ඇඩියාවල නැ/ ගම නැගුම ජනතා.......... | වළල්ගොඩ උපාලි ස්ටෝර්ස් ඉදිරිපිට....... | 888053.19 |
| 04 | 2021.12.02 | 1577 | 766920 සිට 766933 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3034038.62 |
| 05 | 2021.12.31 | 1611 | 787610 | අතුල ටයර් සෙන්ටර් | ටයර්,ටියුබ්,බැටරි මිලදී ගැනීම | 521640.00 |
| එකතුව | | | | | | **5068109.41** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2021 දෙසැම්බර් මස 5,068,109.41 වූ ලක්ෂ 05 ට වැඩි ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා විසින් සභාගත කරන ලද යෝජනා</u>

**05.08) 212 දියපොට ග්‍රාම නිලධාරී වසමේ ගමකන්ද පොදු සුසාන භූමිය මැන සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
මාගේ කොට්ඨාශයට අයත් 212 දියපොට ග්‍රාම නිලධාරී වසමේ ගමකන්ද පොදු සුසාන භූමිය මැන සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා පුෂ්ප කුමාරි මිය</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 212 දියපොට ග්‍රාම නිලධාරී වසමේ ගමකන්ද පොදු සුසාන භූමිය මැන සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.09) බටතිඹුර සිට ගමකන්ද දක්වා ගම්සභා පාර සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
මාගේ කොට්ඨාශයට අයත් බටතිඹුර සිට ගමකන්ද දක්වා ගම්සභා පාර සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, බටතිඹුර සිට ගමකන්ද දක්වා ගම්සභා පාර සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.10) සුදුගල ග්‍රාම නිලධාරී වසමේ බුලත්වැල්කන්ද රංජී මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා

සුදුගල ග්‍රාම නිලධාරී වසමේ බුලත්වැල්කන්ද රංජී මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, සුදුගල ග්‍රාම නිලධාරී වසමේ බුලත්වැල්කන්ද රංජී මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.11) කපරැල්ල සමන් මහතාගේ නිවස දක්වා මාර්ගය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා

මාගේ කොට්ඨාශයට අයත් කපරැල්ල සමන් මහතාගේ නිවස දක්වා මාර්ගය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කපරැල්ල සමන් මහතාගේ නිවස දක්වා මාර්ගය සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා විසින් සභාගත කරන ලද යෝජනා.

**05.12) කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,තුන්වැනි පටුමග සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනිමට අදාළ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා

මාගේ කොට්ඨාශයට අයත් කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,තුන්වැනි පටුමග සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,තුන්වැනි පටුමග තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.13) කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,පළමු වන පටුමග ඉතිරි කොටස තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනිමට අදාළ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා

මාගේ කොට්ඨාශයට අයත් කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,පළමු වන පටුමග ඉතිරි කොටස තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රරත්න කුරුකුල මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,පළමු වන පටුමග ඉතිරි කොටස තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.** හදිසි යෝජනා

**06.01) කැලි කසල බැහැර කිරීම විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
කැලි කසල බැහැර කිරීම විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කැලි කසල බැහැර කිරීම විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.02) උඩවලව මුදුන්මංකඩ ක්‍රීඩා පිටියේ දැල් වැට ඉදිකිරීම වෙනුවෙන් සකස් කරන ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>
උඩවලව මුදුන්මංකඩ ක්‍රීඩා පිටියේ දැල් වැට ඉදිකිරීම වෙනුවෙන් සකස් කරන ලද රු:1,450,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා.</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව මුදුන්මංකඩ ක්‍රීඩා පිටියේ දැල් වැට ඉදිකිරීම වෙනුවෙන් සකස් කරන ලද රු:1,450,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට, ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථයේ ABS පද්ධතිය, එයා(ර්) බැග් පද්ධතිය, වායු සමීකරණ පද්ධතිය හා ඩීසල් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථයේ ABS පද්ධතිය, එයා(ර්) බැග් පද්ධතිය, වායු සමීකරණ පද්ධතිය හා ඩීසල් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමීර රුක්ෂාන් මහතා</u>
ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PF 7457 අංක දරණ කැබ් රථයේ ABS පද්ධතිය, එයා(ර්) බැග් පද්ධතිය, වායු සමීකරණ පද්ධතිය හා ඩීසල් පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට, ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.04) ඇත්හොඩගල කසල අංගනය කසලවලින් පිරී ගොස් ඇති බැවින්,එය තල්ලු කිරීම සඳහාත්,කසල බැහැර කරන ලද එම භූමිය බාහිර පාර්ශවයක් විසින් අත්පත් කරගෙන ඇති බැවින් කසල බැහැර කිරීම සඳහා ඊට යාබදව ඇති කැලෑබද පෙදෙස ශුද්ධ පවිත්‍ර කිරීම සඳහාත්, කදුරුගස්ආර යුධ හමුදා කඳවුරට අයත් D-40 වර්ගයේ බුල්ඩෝසර් යන්ත්‍රය කසල අංගනය දක්වා ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය ට්‍රක් රථයක් සහ ඉන්ධන ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇත්හොඩගල කසල අංගනය කසලවලින් පිරී ගොස් ඇති බැවින්,එය තල්ලු කිරීම සඳහාත්,කසල බැහැර කරන ලද එම භූමිය බාහිර පාර්ශවයක් විසින් අත්පත් කරගෙන ඇති බැවින් කසල බැහැර කිරීම සඳහා ඊට යාබදව ඇති කැලෑබද පෙදෙස ශුද්ධ පවිත්‍ර කිරීම සඳහාත්, කදුරුගස්ආර යුධ හමුදා කඳවුරට අයත් D-40 වර්ගයේ බුල්ඩෝසර් යන්ත්‍රය කසල අංගනය දක්වා ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය ට්‍රක් රථයක් සහ ඉන්ධන ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇත්හොඩගල කසල අංගනය කසලවලින් පිරී ගොස් ඇති බැවින්,එය තල්ලු කිරීම සඳහාත්,කසල බැහැර කරන ලද එම භූමිය බාහිර පාර්ශවයක් විසින් අත්පත් කරගෙන ඇති බැවින් කසල බැහැර කිරීම සඳහා ඊට යාබදව ඇති කැලෑබද පෙදෙස ශුද්ධ පවිත්‍ර කිරීම සඳහාත්, කදුරුගස්ආර යුධ හමුදා කඳවුරට අයත් D-40 වර්ගයේ බුල්ඩෝසර් යන්ත්‍රය කසල අංගනය දක්වා ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය ට්‍රක් රථයක් සහ ඉන්ධන ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06.05) සතිපොල බදු වාරික මුදල් සෑම මසකම 28 වන දිනට පෙර අය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
සතිපොල බදු වාරික මුදල් මීට කලින් ගෙව්වේ සෑම මසකම 10 වන දිනට පෙර.බදුකරුවන් විසින් ඉල්ලීමක් කරල තියෙනවා, මෙම බදු මුදල් සෑම මසකම 28 වන දිනට පෙර ගෙවීමට අවකාශ සලසා දෙන ලෙසට.මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, සතිපොල බදු වාරික මුදල් සෑම මසකම 28 වන දිනට පෙර අය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06.06) පහත සඳහන් ඇස්තමේන්තු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

| අනු අංකය | ඇස්තමේන්තුවේ නම | සංශෝධිත ඇස්තමේන්තු මුදල (රු:) |
|---|---|---|
| **01.** | මහයාය විහාරස්ථාන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | 1,425,500.00 |
| **02.** | තුංකම වැව්සිරිගම වාමර මහතාගේ නිවස මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම | 1, 105,600.00 |
| **03.** | කදුරුගස්ආර කච්චිගල මාර්ගයේ,කච්චිගල පාසල් මාවතේ සපත්තු පාලම සහ පැතිබැම්ම ඉදිකිරීම | 491,000.00 |

| | | |
|---|---|---|
| **04.** | තෝරගල කනත්ත ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම | 1,183,500.00 |
| **05.** | රංචමඩම තලාව මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම | 546,300.00 |

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඉහත සඳහන් ඇස්තමේන්තු මීට පෙර අපි සභාවට ඉදිරිපත් කරල අනුමැතිය අරන් තියෙන්නේ.නමුත් එම ඇස්තමේන්තුවල ඇස්තමේන්තු ගත මුදල ඉහත පරිදි සංශෝධනය කිරීමට අවශ්‍යයයි. මේ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඉහත සඳහන් ඇස්තමේන්තු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.07) 2022 අයවැය යෝජනා අනුව බ්ලොක් ගල් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට බ්ලොක් ගල් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා 2022 අයවැයට යෝජනාවක් ඉදිරිපත් වුණා.මේ සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 අයවැය යෝජනා අනුව බ්ලොක් ගල් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.08) 2022 අයවැය යෝජනා අනුව බ්ලොක් ගල් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා 02 කණුව සතිපොල භූමියේ කාර්යාල කාමරයක් සහ ගබඩා කාමරයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
2022 අයවැය යෝජනා අනුව බ්ලොක් ගල් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා 02 කණුව සතිපොල භූමියේ කාර්යාල කාමරයක් සහ ගබඩා කාමරයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා පුෂ්ප කුමාරි මිය</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 අයවැය යෝජනා අනුව බ්ලොක් ගල් කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා 02 කණුව සතිපොල භූමියේ කාර්යාල කාමරයක් සහ ගබඩා කාමරයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.09) ජඳුර ග්‍රාම නිලධාරී වසමේ බෝටියවැව මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ජදුර ග්‍රාම නිලධාරී වසමේ බෝට්ටියවැව මාර්ගය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව යොදා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය **ලබාදීම** සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ජදුර ග්‍රාම නිලධාරී වසමේ බෝට්ටියවැව මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉන්ධන සහිතව ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.10) මුල්ඇඩියාවල විහාරස්ථානය අළුත්වැඩියා කිරීමට අදාල කොටස් බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

මුල්ඇඩියාවල විහාරස්ථානය අළුත්වැඩියා කිරීමට අදාල රු: 1,293,465.06 කොටස් බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, මුල්ඇඩියාවල විහාරස්ථානය අළුත්වැඩියා කිරීමට අදාල රු: 1,293,465.06ක කොටස් බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.11) 2022 වර්ෂයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ වීථි පහන් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

මේ වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාවේ වීථි පහන් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට අවශ්‍යයයි.මිලදී ගැනීමට අවශ්‍ය දේවල් පිළිබඳ විස්තර මෙහෙමයි.

| | |
|---|---|
| ස්විච් | 350.00 |
| වයර් රෝල් | 150.00 |

**ඒ අනුව** 2022 වර්ෂයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ වීථි පහන් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 වර්ෂයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ වීථි පහන් අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ඉහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා විසින් සභාගත කරන ලද යෝජනා.</u>**

**06.12) උඩවලව ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රධාන දොරටුවේ සිට ක්‍රීඩාපිටිය දක්වා මාර්ගය ආරක්ෂාකාරී අයුරින් භාවිත කිරීමට හැකිවන පරිදි සකස් කර සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>**

මාගේ කොට්ඨාශයට අයත් උඩවලව ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රධාන දොරටුවේ සිට ක්‍රීඩාපිටිය දක්වා මාර්ගය ආරක්ෂාකාරී අයුරින් භාවිත කිරීමට හැකිවන පරිදි සකස් කර සංවර්ධනය කිරීම සඳහා සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රධාන දොරටුවේ සිට ක්‍රීඩාපිටිය දක්වා මාර්ගය ආරක්ෂාකාරී අයුරින් භාවිත කිරීමට හැකිවන පරිදි සකස් කර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී.පැතුම් මධුශංඛ මහතා විසින් සභාගත කරන ලද යෝජනා.</u>

**06.13) කදුරුගස්ආර 5 ඇල පොදු සුසාන භූමියේ කම්බි වැට සකස් කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ද්‍රව්‍ය ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී.පැතුම් මධුශංඛ මහතා</u>

කදුරුගස්ආර 5 ඇල පොදු සුසාන භූමියේ කම්බි වැට සකස් කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:317,111.00ක ද්‍රව්‍ය ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කදුරුගස්ආර 5 ඇල පොදු සුසාන භූමියේ කම්බි වැට සකස් කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:317,111.00ක ද්‍රව්‍ය ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.</u>

**06.14) කොලඹගෙආර බිබිලගමයාය ප්‍රජා ශාලාවේ සිවිලිම සකස් කිරීම සඳහාත්,එම භූමිය වටා වැට ඉදිකිරීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් කොලඹගෙආර බිබිලගමයාය ප්‍රජා ශාලාවේ සිවිලිම සකස් කිරීම සඳහාත්,එම භූමිය වටා වැට ඉදිකිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි මහත්මිය</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කොලඹගෙආර බිබිලගමයාය ප්‍රජා ශාලාවේ සිවිලිම සකස් කිරීම සඳහාත්,එම භූමිය වටා වැට ඉදිකිරීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.</u>

**06.15) උඩවලව තිඹොල්කැටිය බණ්ඩාරනායක මාවත තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් උඩවලව තිඹොල්කැටිය බණ්ඩාරනායක මාවත තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, උඩවලව තිඹොල්කැටිය බණ්ඩාරනායක මාවත තාර අතුරා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා විසින් සභාගත කරන ලද යෝජනා.</u>

**06.16) කැටගල්ආර ක්‍රීඩා පිටියේ වේදිකා මණ්ඩපය සඳහා නව විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීමට අදාල ඇස්තමේන්තුව සහ වයරින් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් කැටගල්ආර ක්‍රීඩා පිටියේ වේදිකා මණ්ඩපය සඳහා නව විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීමට අදාල රු:56400.00ක ඇස්තමේන්තුව සඳහාත්, වයරින් කිරීම සඳහා අවශ්‍ය රු:31,170.00ක ද්‍රව්‍ය ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පැතුම් මධුශංඛ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කැටගල්ආර ක්‍රීඩා පිටියේ වේදිකා මණ්ඩපය සඳහා නව විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීමට අදාල රු:56,400.00ක ඇස්තමේන්තුව සඳහාත්, වයරින් කිරීම සඳහා අවශ්‍ය රු:31,170.00ක ද්‍රව්‍ය ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06.17) කැටගල්ආර ක්‍රීඩා පිටියේ ෆ්ලෑෂර් සවි කිරීම වෙනුවෙන් 2" ජී.අයි. බට 06ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

මාගේ කොට්ඨාශයට අයත් කැටගල්ආර ක්‍රීඩා පිටියේ ෆ්ලෑෂර් සවි කිරීම වෙනුවෙන් 2" ජී.අයි. බට 06ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වාසනා වික්‍රමගේ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කැටගල්ආර ක්‍රීඩා පිටියේ ෆ්ලෑෂර් සවි කිරීම වෙනුවෙන් 2" ජී.අයි. බට 06ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.</u>

**06.18) හිඟුර කොට්ඨාශයේ අංක 07,බෝගල්ආර,විහාරගම,කුට්ටිගල,පදලංගල ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී ඒ.ඩී.ලක්ෂ්මන් ආරියතිලක යන අයට මුළුතැන්ගෙයක් ඉදිකරදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>

හිඟුර කොට්ඨාශයේ අංක 07,බෝගල්ආර,විහාරගම,කුට්ටිගල,පදලංගල ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී ඒ.ඩී.ලක්ෂ්මන් ආරියතිලක යන ස්ථිර ආදායමක් නැති පුද්ගලයෙක්.ඔහුගේ බිරිඳ කාලයක් තිස්සේ ආබාධිත තත්ත්වයේ පසුවෙනවා.මොවුන් දැනට තාවකාලික මුළුතැන් ගෙයක් තමයි පාවිච්චි කරන්නේ.එම නිසා ඉහත නම සඳහන් අයට මුළුතැන්ගෙයක් ඉදිකරදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, හිඟුර කොට්ඨාශයේ අංක 07,බෝගල්ආර,විහාරගම,කුට්ටිගල,පදලංගල ලිපිනයේ පදිංචි අඩු ආදායම්ලාභී ඒ.ඩී.ලක්ෂ්මන් ආරියතිලක යන අයට මුළුතැන්ගෙයක් ඉදිකරදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07.කාරක සභා වාර්තා සලකා බැලීම.**

- **2021.12.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>
2021.12.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>
2021.12.31 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව 2021.12.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

I. **2021 දෙසැම්බර් මස ලැබීම් සාරාංශය.**
II. **2021 දෙසැම්බර් මස ගෙවීම් සාරාංශය.**
III. **2021.12.31 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
IV. **2021 දෙසැම්බර් මස ලක්ෂ 05 වැඩි විදයම්.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>
2021 දෙසැම්බර් මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>
එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2021 දෙසැම්බර් මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**09.වෙනත් කරුණු**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>
ගරු සභාපතිතුමණි,ලැබුවා වූ 2022 නව වසර ලංකාවාසී සියළු දෙනාටම සාමය සතුට පිරි සුභ නව වසරක් වේවා කියල ප්‍රාර්ථනා කරනවා.පසුගිය වසරේ සභාපතිවරු,ආසන සංවිධායකවරු, ඇතුළු ආණ්ඩුවට සම්බන්ධ සියළුම මන්ත්‍රීවරු කැදෙව්වා නිමල් ලංසා ඇමතිතුමා විසින් මග නැගුම මන්දිරයට.එහිදී එතුමා ප්‍රකාශ කළා සංවර්ධන කටයුතු සඳහා වසමකට ලක්ෂ විස්සක මුදලක් ලබා දෙනවා කියලා.ඒ සම්බන්ධව වැඩ කටයුතු සිදු වෙන්නේ කොහොමද කියලා මම දැන ගන්න කැමතියි.

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>
ගරු මන්ත්‍රීතුමණි,ඒ එවපු ලක්ෂ 20 ව්‍යාපෘති මේ වෙනකොට විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙලා නැහැ.අපේ ආයතනයේ වතරක් 40% - 50%ක පමණ ක්‍රියාත්මකවීමක් තියෙනවා.ඒ සඳහා ඉදිරියේදී යම්කිසි ක්‍රියාමාර්ගයක් ගනියි.

**ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.**

ගරු සභාපතිතුමණි,සියළු දෙනාටම සුභ අළුත් අවුරුද්දක් වේවා කියල ප්‍රාර්ථනා කරනවා.ගරු සභාපතිතුමණි,අපි ජනතා වරමින් මෙම සභාවට පත්වෙලා ඇවිල්ලා මේ අවුරුද්දේ අප්‍රේල් මාසෙන් අපේ නිල කාලය අවසන්වීමට තිබුණා.යහපාලන ආණ්ඩුව කාලෙ අපට ජනතා සේවය කිරීමට අවස්ථාව ලැබුණේ නැහැ.ඊට අමතරව පසුගිය අවුරුදු දෙක කොරෝනා වසංගතය හේතුවෙන් අපට ඊට අවස්ථාව ලැබුණේ නැහැ.අපේ වසර හතර අයාලේ යමින් තමයි තිබුණේ.ජනතා සේවයක් කිරීමට අවස්ථාව උදා නොවීම සම්බන්ධව අපි බොහොම කනස්සල්ලෙන් හිටියේ.එහෙම අවස්ථාවක අපගේ ආණ්ඩුව විසින් අපගේ ධුරකාලය වසරකින් දීර්ඝ කිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාටත්,පළාත් පාලන ඇමතිතුමාටත්,පක්ෂයේ සියළුම නායකකාරකාදීන්ටත්,පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපගේ ස්තූතිය සහ ගෞරවය පුද කරනවා.ජනතා මෙහෙවරේ යෙදෙන්න අපට තවත් අවස්ථාවක් ලැබිල තියෙනවා.පෙර වසරවලට වඩා ඒ සඳහා අවස්ථාව ලැබෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.මම ප්‍රාර්ථනා කරනවා කොරෝනා වැනි දරුණු වසංගතයන්ගෙන් තොරව ජීවත්වීමට ජනාධිපතිතුමාටත්,පළාත් පාලන ඇමතිතුමාටත්,සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රී මණ්ඩලයටත්,රාජ්‍ය නිලධාරීන් සියළුම දෙනාටත් අවස්ථාව උදාවේවා කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩී.එච්.සීතා පද්මිණී මහත්මිය**

ගරු සභාපතිතුමණි,පසුගිය දිනක මාගේ කොට්ඨාශයේ ළමා හා කාන්තා ආරක්ෂණ කමිටු පිහිටවනු ලැබුවා.ගරු ලේකම්තුමා ඒ සඳහා සහභාගි වුණා.විශේෂයෙන්ම එතුමට මම ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම මේ සඳහා කොළඹගෙආර විද්‍යාලයේ විදුහල්පතිතුමන්,සංඛපාල විද්‍යාලයේ විදුහල්පතිතුමන්,සමෘද්ධි සංවර්ධන නිලධාරීතුමිය,ග්‍රාම නිලධාරීතුමා,ඇතුළු බොහෝ පිරිසක් සහභාගි වුණා.පොලිස් ස්ථානාධිපතිතුමා වෙනුවට නිලධාරියෙක් සම්බන්ධ කරලා තිබුණා.අපේ උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා පාසලේ ආචාර්යවරයෙක් නිසා එතුමටත් මම ආරාධනා කළා.නමුත් දරුවා සමග රෝහල් ගතවෙලා සිටිය නිසා එතුමට සහභාගිවීමට නොහැකි වුණත්,මට දුරකථනයෙන් කතා කරලා අවශ්‍ය සහයෝගය මට ලබාදුන්නා.ඒකත් මට ලොක් දෙයක්.දරුවේ කියන්නේ අපට ඉන්න ලොකුම සම්පත.ඒ දරුවන් ආරක්ෂා කර ගැනීම, රැක බලා ගැනීම ඉතාම වැදගත්.කමිටුව අවසානයේ නිවසක් නැති දරු පවුලකට නිවසක් ඉදි කරදීම සඳහා අවස්ථාවක් අපට උදාවුණා.ඉදිරි කාලයේදී ඒ වැඩ කටයුතු නිමා කිරීමට අපට හැකිවෙයි.ඒ සම්බන්ධව ගොඩක් සතුටුයි.ඒ වගේම මම මේ අවස්ථාවේ ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා පී.අබේනායක මහත්තයා.එතුමා නිසා තමයි මම අද මෙතැනට මහජන නියෝජිතවරියක් විදියට ඇවිත් ඉන්නේ.ඒ සඳහා මග පෙන්වීම කලේ එතුමා.ඒ වගේම රනිල් වික්‍රමසිංහ අපේ නායකතුමත්,වජිර අබේවර්ධන සංවිධායකතුමා ඇතුළු පක්ෂයේ සියළුම දෙනාට ස්තූතිවන්ත වෙනවා.සියළු දෙනාටම මම සුභ පතනවා සියළු වැඩ කටයුතු සාර්ථකව කරගෙන යාමට ශක්තිය,ධෛර්යය ලැබේවා කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය**

ගරු සභාපතිතුමණි,පසුගිය දවසක ජුලංගැටේ ප්‍රදේශයේ සෝමසිරි කියල මහත්මයෙක් ඔබතුමාව හමුවෙන්න ඇවිත් ලිපියක් භාරදීලා තිබුණා.ඇත්තටම එතුමා අසරණ දුප්පත් මහත්මයෙක්.හතුමට මේ වෙනකොට ඉන්න තැනක් නැහැ පසුගිය වර්ෂාවට එතුමගෙ ගේ කඩා වැටුණා.ඊට පස්සෙ ගමේ මිනිස්සු පක්ෂ භේදයකින් තොරව එකතු වෙලා බිත්ති ටික බැඳලා දුන්නා.එතුමට ඒ නිවසේ වහල ගහගන්න විදියක් නැහැ කියලා මාව හමුවෙන්න ආවා.ඔබතුමාට එවපු ලිපියේ පිටපතක් මටත් එවලා තිබුණා.ඔබතුමා එතුමට උපදෙස් දීල තිබුණා,අලහප්පෙරුම මන්ත්‍රීතුමියට ඒ ලිපිය භාර දෙන්න කියලා.එතුමා කියනවා එතුමියට ලිපිය එව්වා කියලා.හැබැයි මේක සභාවට ඉදිරිපත් කරලා නැහැ.ඒ ගැන කනගාටුයි.අපි මේ වගේ අසරණ වුණ කෙනෙකුට උදව් කළ යුතුයි.එයාගෙ පැටිකිරිය හොයල බැහැර කළ යුතු නැහැ.මොකද අපි ඔවුන්ට උදව් කරන්නේ අපේ පෞද්ගලික මුදලින් නෙමෙයි.මම ඔබතුමාගෙන් අහනවා, අපට මේ සම්බන්ධව යමක් කළ හැකිද කියා.ඔහුට අවශ්‍ය සෙවිලි තහඩු 20ක් පමණ.

**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.**

ගරු මන්ත්‍රීතුමිය,ඒ කාරණය යෝජනාවක් විදියට සභාවට ඉදිරිපත් කරන්න.මගෙන් අහන්න අවශ්‍ය නැහැ,මහජන නියෝජිතයෙකුට අයිතිය තියෙනවා තමන්ගේ ජනතාවට සේවය කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය</u>**
හොඳයි සභාපතිතුමණි,ඊළඟ සභාවට යෝජනාව ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>**
මුලින්ම ලැබුවා වූ 2022 නව වසර ගරු උප සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රී මණ්ඩලයටත්,ලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයටත්,සේවක මණ්ඩලයටත්,ලංකාවාසී,ලෝකවාසී සියළුම දෙනාටත් සුභ නව වසරක් වේවා කියල ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම අපගේ ආණ්ඩුව විසින් අපගේ ධූරකාලය වසරකින් දීර්ඝ කිරීමට කටයුතු කරල තිබෙනවා.පසුගිය වසර දෙක පුරාවටම කොරෝනා වසංගතය හේතුවෙන් ජනතාවට සේවය කිරීමට අපට අවස්ථාව අහිමි වුණා.නව වසරක් ජනතා සේවයේ යෙදීමට අවස්ථාව උදාකර දුන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්,ගරු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, පළාත් පාලන විෂය භාර ඇමතිතුමාටත්,පක්ෂයේ සියළුම දෙනාටත්, අපගේ ස්තූතිය සහ ගෞරවය පුද කරනවා.

- **ගරු සභාපති තුමාගේ ස්තූති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පූර්වක ස්තූතිය පුදකර සිටිනවා.

2022.01.20 වන දින පැවති මහ සභාව මධ්‍යාහ්න 12.00ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.